# 3 ව්‍යාපාර සංවිධාන




මෙම පරිච්ඡේදය මගින් පහත දක්වෙන කරුණු පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

3.1 ව්‍යාපාර සංවිධාන වර්ග පිළිබඳ මූලික තොරතුරු
- ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම
- ව්‍යාපාර සංවිධාන වර්ග හා මූලික ලක්ෂණ

3.2 යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීම
- පරමාර්ථ අනුව
- පරිමාණය අනුව
- කළමනාකරණය සිදු කරන ආකාරය අනුව

3.3 ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම
- ලියාපදිංචිය සඳහා අනුගමනය කළ යුතු පියවර
- ලියාපදිංචි කිරීමේ ලියවිලි
- ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන

## 3.1 ව්‍යාපාර සංවිධාන වර්ග පිළිබඳ මූලික තොරතුරු

රටක ජනගහනය වර්ධනය වීමත් සමග භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා බෙදා හැරීමේ කටයුතු ද පුළුල් වී ඇත. මේ නිසා මිනිසාගේ අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට විවිධ වර්ගයේ ව්‍යාපාර සංවිධාන බිහි වී ඇත. මෙසේ අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් හෝ ඒකරාශී වීම ව්‍යාපාර සංවිධානයක් ලෙස හැඳින්වේ.

විවිධ පාර්ශ්ව ව්‍යාපාර සඳහා අරමුදල් යොදවයි. එසේ අරමුදල් යොදවමින් අවදානම් බාර ගන්නා පුද්ගලයෝ ව්‍යාපාර හිමිකරුවෝ නැතිනම් අයිතිකරුවෝ වෙති. හිමිකාරිත්වය පදනම් කරගෙන පෞද්ගලික අංශයේත් රාජ්‍ය අංශයේත් ව්‍යාපාර සංවිධාන වර්ග කිහිපයක් හඳුනා ගත හැකි ය. එසේ ම ව්‍යාපාරිකයෝ විවිධ වූ අරමුණු සපුරා ගැනීම සඳහා ව්‍යාපාර පත්වාගෙන යති. ඒ අනුව ඇතැම් ව්‍යාපාර ලාභ ලැබීමේ අරමුණින් පවත්වා ගෙන යන අතර සමාජ සුභ සාධන අරමුණු පදනම් කරගත් ව්‍යාපාර ද දක්නට ඇත. ව්‍යාපාරිකයාට සපයා ගත හැකි සම්පත් ප්‍රමාණය අනුව ඔහුට සුළු පරිමාණ හෝ මහා පරිමාණ ව්‍යාපාර ආරම්භ කළ හැකි ය. මෙම ව්‍යාපාර සංවිධාන වර්ග අතරින් තමාට සුදුසු ව්‍යාපාරයක් තෝරා ගැනීමට ව්‍යාපාරිකයා දක්ෂ විය යුතු ය.

## ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම

ව්‍යාපාර විවිධ ආකාරයට සංවිධාන වී ඇත. මෙම විවිධ ස්වරූපවල ව්‍යාපාර සංවිධාන වර්ග විවිධ නිර්ණායක මත පහත දැක්වෙන පරිදි වර්ග කළ හැකි ය.

- හිමිකාරිත්වය අනුව
- අරමුණ අනුව
- පරිමාණය අනුව

## හිමිකාරිත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම


ව්‍යාපාරවලට අවශ්‍ය අරමුදල් යොදවමින් එහි අවදානම දරන පුද්ගලයෝ හිමිකරුවන් ලෙස හැඳින්වෙති. ව්‍යාපාරයක් උපයන ලාභ භුක්ති විඳන්නේත් පාඩු විඳ දරාගන්නේත් ව්‍යාපාරයේ අයිතිකරුවෝ ය. ඒ අනුව හිමිකාරිත්වය මත ව්‍යාපාර සංවිධාන ප්‍රධාන වර්ග දෙකකට බෙදා දැක්විය හැකි ය.

- පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හිමිකාරිත්වය යටතේ ව්‍යාපාර සංවිධාන වර්ග වී ඇති ආකාරය පහත දැක්වේ.




රූපය 3.1 - හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම.

### පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන

ව්‍යාපාරයක හිමිකාරිත්වය පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් සතුවන ව්‍යාපාර පෞද්ගලික අංශයේ ව්‍යාපාර ලෙස හැඳින්වෙයි. පෞද්ගලික අංශයේ ව්‍යාපාර ඒක පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්, සමූපකාර සමිති හා සමිති සංවිධාන ආදී ලෙස තවදුරටත් වර්ග කළ හැකි වේ.

### රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන


රජය විසින් ප්‍රාග්ධනය සපයා ඇති, හිමිකාරිත්වය රජය සතු වූ ව්‍යාපාර රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන වේ. මේ යටතේ රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, රාජ්‍ය සමාගම්, පළාත් සභා හා පළාත් පාලන ආයතනවලට අයත් ව්‍යාපාර හඳුනාගත හැකි ය.

## අරමුණු අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම

විවිධ අරමුණු සපුරා ගැනීම සඳහා විවිධ සංවිධාන පවත්වාගෙන යනු ලැබේ. ව්‍යාපාරයක හිමිකරුවෝ ද මෙසේ යම් අරමුණක් ඉටු කර ගැනීම සඳහා ව්‍යාපාර පවත්වා ගෙන යති. පවත්වා ගෙන යන අරමුණු අනුව ව්‍යාපාර පහත දැක්වෙන ආකාරයට වර්ග කළ හැකි ය.

- ලාභ අරමුණු කර ගත් ව්‍යාපාර සංවිධාන
- ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධාන

පහත දැක්වෙන රූප සටහනෙන් එය පැහැදිලි වේ.




රූපය 3.2 - අරමුණු අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම

### ලාභ අරමුණු කරගත් ව්‍යාපාර

ලාභ ඉපැයීම ප්‍රධාන අරමුණ කරගත් ව්‍යාපාර, ලාභ අරමුණු කරගත් ව්‍යාපාර ලෙස හැඳින්වේ. මෙවැනි ව්‍යාපාර සංවිධාන වර්ග පෞද්ගලික අංශයේ මෙන් ම රාජ්‍ය අංශය තුළ ද ක්‍රියාත්මක වේ.

### ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර

මෙවැනි ව්‍යාපාරවල ප්‍රධාන අරමුණ වන්නේ සාමාජිකයන්ගේ සහ සමාජයීය සුබ සාධනය යි. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර පෞද්ගලික අංශයේ මෙන් ම රාජ්‍ය අංශයේ ද ක්‍රියාත්මක වේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.


## පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම

ව්‍යාපාර සංවිධානයක පරිමාණය විවිධ නිර්ණායක මත තීරණය කරනු ලැබේ. එසේ සලකනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායක කිහිපයක් පහත දැක්වේ.

- ව්‍යාපාරයේ ප්‍රාග්ධන ප්‍රමාණය
- සේවක සංඛ්‍යාව
- භාවිත කරන බල ශක්ති ප්‍රමාණය
- ව්‍යාපාරයට ඇති වෙළඳපල කොටස

ව්‍යාපාර සංවිධාන පරිමාණය අනුව ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර
- මහා පරිමාණ ව්‍යාපාර




රූපය 3.3 - පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම.

### සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවිධාන

විවිධ ආයතන සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර වර්ගීකරණය සඳහා විවිධ නිර්ණායක හඳුනා ගෙන ඇත. ඒ අනුව මහා පරිමාණ ව්‍යාපාරවලට සාපේක්ෂ ව සලකා බැලීමේ දී කුඩා ප්‍රාග්ධනයක් ආයෝජනය කර ඇති, අඩු සේවක සංඛ්‍යාවක් සිටින, වෙළඳපල කොටස කුඩා වූ ව්‍යාපාර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලෙස හැඳින්විය හැකි ය.



රූපය 3.4

**නිදසුන් :-**

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හඳුන්වාදෙන පරිදි සේවක සංඛ්‍යාව 25ට අඩු ව්‍යාපාර

### මහා පරිමාණ ව්‍යාපාර සංවිධාන

වැඩි ප්‍රාග්ධනයක් ආයෝජනය කර ඇති විශාල සේවක සංඛ්‍යාවක් සේවය කරන විශාල වෙළෙඳපල කොටසක් හිමි වූ, අදාළ කර්මාන්තය තුළ විශාල බලපෑමක් කළ හැකි ව්‍යාපාර මහා පරිමාණ ව්‍යාපාර ලෙස සරල ව හැඳින්විය හැකි ය.

**නිදසුන් :-**

විශාල සේවකයන් ප්‍රමාණයක් සේවය කරන කර්මාන්ත ශාලාවක්



රූපය 3.5

**මීළඟට ඉහත දැක් වූ ව්‍යාපාර සංවිධාන වර්ග පිළිබඳ ව පුළුල් ව සලකා බලමු.**

## ඒක පුද්ගල ව්‍යාපාර

හිමිකාරිත්වය එක් පුද්ගලයෙකු සතු ව්‍යාපාර තනි පුද්ගල ව්‍යාපාර ලෙස හැඳින්විය හැකි ය. ලොව සෑම රටක ම වාගේ බහුල ව පවතින ව්‍යාපාර සංවිධාන වර්ගය ද මෙය වේ.

පහසුවෙන් ආරම්භ කළ හැකි වීමත් කුඩා ප්‍රාග්ධනයක් අවශ්‍ය වීමත් ස්වාධීන ව තීරණ ගතහැකි වීමත් නිසා මෙම ව්‍යාපාර සංවිධාන වර්ගය බහුල ව දක්නට ලැබේ. හිමිකරුගේ දක්ෂතාව හා කැපවීම මත මෙවැනි ව්‍යාපාරයක කටයුතුවල සාර්ථක බව රඳා පවතී.



රූපය 3.6

### ඒක පුද්ගල ව්‍යාපාරවල ලක්ෂණ

ඒක පුද්ගල ව්‍යාපාරවල පහත දැක්වෙන ලක්ෂණ දක්නට ඇත.

- **ප්‍රාග්ධනය අයිතිකරු වන තනි පුද්ගලයෙකු විසින් යෙදවීම**

  ව්‍යාපාරයට අවශ්‍ය ප්‍රාග්ධනය අයිතිකරුවන් විසින් තනි ව සපයා ගත යුතු වේ. අයිතිකරුගේ ඉතිරිකිරීම් හෝ ණය මුදල් ප්‍රාග්ධනය ලෙස යෙදවිය හැකි ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

- **ලාභ හෝ අලාභ තනි ව භුක්ති විඳීම**

  ඒක පුද්ගල ව්‍යාපාරය උපයන සියලු ම ලාභ අයිතිකරු සතු වේ. එසේ ම අලාභයක් ඇති වුවහොත් එය ද අයිතිකරුට තනි ව විඳ දරා ගැනීමට සිදු වේ.

- **අයිතිකරුගේ වගකීම අසීමිත වීම**

  ඒක පුද්ගල ව්‍යාපාරයක අයිතිකරුගේ වගකීම අසීමිත වේ. මේ අනුව වගකීම, යෙදූ ප්‍රාග්ධනයට පමණක් සීමා නොවේ. ඔහු සතු වෙනත් දේපල පවා ව්‍යාපාරයේ වගකීම් පියවීම සඳහා කැප කිරීමට සිදුවිය හැකි අතර එසේ කැප කළ යුතු ප්‍රමාණයට නිශ්චිත සීමාවක් නැත.

- **නීතිමය පුද්ගල භාවයක් නොමැති වීම**

  ඒක පුද්ගල ව්‍යාපාරයකට ව්‍යාපාරයේ නමින් නීතිමය කටයුතුවල යෙදිය නොහැකි ය. එසේ කළ හැක්කේ ව්‍යාපාරිකයාගේ පෞද්ගලික නමින් පමණි. නිදසුන් ලෙස ගිවිසුම්වලට එළැඹීම, වාහන මිල දී ගැනීම, බැංකු ණය ලබා ගැනීම, නඩු පැවරීම, ව්‍යාපාර නාමයෙන් නොව තමාගේ පෞද්ගලික නමින් කළ යුතු ය.

- **අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම**

  ඒක පුද්ගල ව්‍යාපාරයක අයිතිකරු මිය යාම හෝ උමතු වීම වැනි හේතු නිසා එම ව්‍යාපාරය අවසන් විය හැකි ය.

- **ලියාපදිංචිය අනිවාර්ය නොවීම**

  සාමාන්‍යයෙන් ඒක පුද්ගල ව්‍යාපාර ලියාපදිංචිය අනිවාර්ය නොවේ. එහෙත් ව්‍යාපාරය අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වා ගෙන යන්නේ නම්, අදාළ පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතු ය.

ඉහත සඳහන් කළ ලක්ෂණවලට අමතර ව තනි ව තීරණ ගතහැකි වීම, පාලනය අයිතිකරු විසින් සිදු කිරීම සහ ඕනෑ ම විටක දී අයිතිකරුගේ කැමැත්ත පරිදි ව්‍යාපාරය අවසන් කළ හැකි වීම යනා දී ලක්ෂණ ද ඒක පුද්ගල ව්‍යාපාරයක දක්නට හැකි වේ.

### ඒක පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසි

අනෙකුත් ව්‍යාපාර සංවිධාන වර්ගවලට සාපේක්ෂ ව ඒක පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ පවත්නා ප්‍රධාන වාසි පහත දැක්වෙන ආකාරයට පැහැදිලි කළ හැකි ය.

- **පහසුවෙන් ආරම්භ කළ හැකි වීම**

  අනෙකුත් ව්‍යාපාරවලට සාපේක්ෂ ව බලපාන නීතිරීති අවම වීම, ආරම්භ කිරීමේ පිරිවැය අඩු වීම යනාදී කරුණු නිසා ඒක පුද්ගල ව්‍යාපාර පහසුවෙන් ආරම්භ කළ හැකි ය.

- **සියලු ම ලාභ අයිතිකරු සතු වීම**

  උපයනු ලබන සියලු ම ලාභ අයිතිකරු විසින් තනි ව භුක්ති විඳිනු ලැබේ.

* **ව්‍යාපාරික තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා වීම**
  ඒක පුද්ගල ව්‍යාපාරයක සියලු ම කළමනාකරණ හා පරිපාලන කටයුතු බොහෝ විට අයිතිකරු විසින් ම සිදු කරන බැවින් ව්‍යාපාරික තොරතුරු බාහිර පාර්ශ්වවලට ගලා යාම අවම වේ.

* **තම දක්ෂතා උපරිම ව යෙදිය හැකි වීම**
  සියලු ප්‍රතිලාභ තමාට හිමිවන බැවින් දක්ෂතා හා කැපවීම උපරිම ව යෙදවීම තුළින් ව්‍යාපාරය දියුණු කර ගැනීමට අවස්ථාව උදා වේ.

* **තීරණ ගැනීමේ ස්වාධීන බව**
  ව්‍යාපාරය පිළිබඳ ව සියලු තීරණ අයිතිකරු විසින් ගනු ලබන බැවින් අවශ්‍ය ක්ෂණික තීරණ ගැනීමට හැකි ය.

## ඒක පුද්ගල ව්‍යාපාර සංවිධානවල අවාසි

අනෙකුත් ව්‍යාපාර සංවිධාන වර්ගවලට සාපේක්ෂ ව ඒක පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ පවත්නා ප්‍රධාන අවාසි පහත දැක්වෙන ආකාරයට පැහැදිලි කළ හැකි ය.

* **අයිතිකරුගේ වගකීම අසීමිත වීම**
  ව්‍යාපාරය ලබාගන්නා සියලු ම ණය සඳහා අයිතිකරු පෞද්ගලික ව වගකිව යුතු වේ. ව්‍යාපාරය සතු සම්පත්වල වටිනාකමට වඩා ණය ප්‍රමාණය වැඩි වුවහොත් එය පියවීමට අයිතිකරුගේ අනෙකුත් පෞද්ගලික දේපල පවා කැප කළ යුතු ය.

* **ප්‍රාග්ධනය රැස්කරගැනීමේ දුෂ්කරතා පැවතීම**
  තනි පුද්ගලයෙකු සතු මූල්‍ය ශක්තිය සීමා වේ. එමෙන් ම ඒක පුද්ගල ව්‍යාපාරවල පවතින ඉහළ අවදානමත් අයිතිකරුගේ අසීමිත වගකීමත් නිසා බැංකු වැනි බාහිර පාර්ශ්වයන්ගෙන් ද ප්‍රාග්ධනය රැස්කරගැනීම අපහසු වේ.

* **අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම**
  අයිතිකරු මිය යෑම, උමතු වීම වැනි හේතු නිසා ව්‍යාපාර කටයුතු අවසන් විය හැකි ය.

* **ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් හිමි නොවීම**
  ඒක පුද්ගල ව්‍යාපාරයකට නීතිමය පුද්ගල භාවයක් නොමැත. මේ නිසා ව්‍යාපාරයේ සෑම නීතිමය කටයුත්තක් ම අයිතිකරුගේ පෞද්ගලික නමින් සිදු කළ යුතු ය.

* **අයිතිකරු තනි ව ගන්නා තීරණ ඇතැම් විට අසාර්ථක විය හැකි වීම**
  සාමූහික ව ගන්නා තීරණවලට සාපේක්ෂ ව තනි පුද්ගලයෙකු විසින් ඔහු සතු දැනුම හා පළපුරුද්ද අනුව ගන්නා තීරණ සමහරවිට අසාර්ථක විය හැකි ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## හවුල් ව්‍යාපාර

ලාභ ලැබීමේ අරමුණින් පොදුවේ පවත්වාගෙන යන පුද්ගලයන් අතර පවත්නා සම්බන්ධතාව හවුල් ව්‍යාපාරයක් ලෙස හැඳින්විය හැකි ය. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත හවුල් ව්‍යාපාර සඳහා බලපායි. ගණකාධිකාරීවරුන්, නීතිඥයන්, බදු නිලධාරීන් සහ වෛද්‍යවරුන් වැනි වෘත්තීන්වල යෙදී සිටින අය ද හවුල් ව්‍යාපාර පවත්වාගෙන යනු දැකිය හැකි ය.

**නිදසුන :-**

වරලත් ගණකාධිකාරීවරුන් කිහිප දෙනෙකු විසින් විගණන ආයතනයක් පවත්වාගෙන යාම.



රූපය 3.7

### හවුල් ව්‍යාපාරවල ලක්ෂණ

අනෙකුත් ව්‍යාපාර සංවිධානවලට සාපේක්ෂ ව හවුල් ව්‍යාපාරවල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- **සාමාජික සංඛ්‍යාව**

  හවුල් ව්‍යාපාරයක් ඇරඹීම සඳහා අවම වශයෙන් සාමාජිකයන් දෙදෙනෙකු වත් සිටිය යුතු අතර උපරිමය සාමාජිකයන් 20ක් සිටිය යුතු බව 2007 අංක 07 දරන සමාගම් පනත අනුව තීරණය කර ඇත.

- **හවුල් ගිවිසුම**

  හවුල් ව්‍යාපාරයක් ඇති වන්නේ හවුල්කරුවන් අතර ඇති කරගන්නා එකඟතාවක් මත ය. එම එකඟතාව හවුල් ගිවිසුම ලෙස හැඳින්වේ. මෙය ලිඛිත ව, වාචික ව හෝ ව්‍යංගයෙන් ඇති විය හැකි ය. වංචා වැලැක්වීමේ ආඥාපනතට අනුව හවුල් ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධනය රු 1000ක් හෝ ඊට වඩා වැඩි නම් හවුල් ව්‍යාපාරය ලිඛිත ගිවිසුමක් යටතේ පවත්වාගෙන යා යුතු වේ. මෙම ලිඛිත ගිවිසුම හවුල් ඔප්පුව නමින් හැඳින්වේ.

**හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වීම**

හවුල්කරුවන් ව්‍යාපාරයේ ණයතුරුස් සම්බන්ධ ව අසීමිත ව වගකිව යුතු ය. ව්‍යාපාරයේ ණය ගෙවීමට එහි වත්කම් ප්‍රමාණවත් නොවේ නම් හවුල්කරුවන් ඔවුන්ගේ පෞද්ගලික දේපළ පවා යොදවමින් හෝ ණය බේරුම් කළ යුතුය.

**හවුල් ව්‍යාපාර ලියා පදිංචිය අනිවාර්ය නොවීම**

හවුල් ව්‍යාපාරයක සියලු හවුල්කරුවන්ගේ සම්පූර්ණ නම්වලින් පවත්වාගෙන යන්නේ නම් ලියාපදිංචි කිරීම අවශ්‍ය නොවේ. එහෙත් හවුල්කරුවන්ගේ නම්වලින් හැර වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ නම් අදාළ පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතු ය.

**නෛතික පුද්ගල භාවයක් නොමැති වීම**

හවුල් ව්‍යාපාරයක් නීතිය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස නොසැලකේ. මේ නිසා හවුල් ව්‍යාපාරයේ නමින් නීතිමය කටයුතුවලට එළැඹිය නොහැකි ය. නිදසුන් ලෙස ගිවිසුම්වලට එළැඹීම, වාහන මිල දී ගැනීම, බැංකු ණය ලබා ගැනීම, නඩු පැවරීම, ව්‍යාපාර නාමයෙන් නොව තම තමන්ගේ පෞද්ගලික නමින් කළ යුතු ය.

**අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම**

හවුල්කරුවෙකු මිය යාම, උමතු වීම, වැනි හේතු නිසා ද ඔවුන් කරගෙන යන හවුල් ව්‍යාපාරයේ පැවැත්මට බාධා ඇති විය හැකි ය.

## හවුල් ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසි

අනෙකුත් ව්‍යාපාර සංවිධාන වර්ගවලට සාපේක්ෂ ව හවුල් ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ පහත දැක්වෙන වාසි දැකිය හැකි ය.

**පහසුවෙන් ආරම්භ කළහැකි වීම**

ඒක පුද්ගල ව්‍යාපාරය මෙන් ම හවුල් ව්‍යාපාර ද ආරම්භ කිරීම පහසු ය. හවුල් ව්‍යාපාර ඇරඹීමේ දී මෙන් ම පවත්වාගෙන යාමේ දී බලපාන නීති රීති සාපේක්ෂ ලෙස අවම මට්ටමක පවතී.

**වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි වීම**

දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හවුල් ව්‍යාපාරයට සහභාගී වන බැවින් ඒක පුද්ගල ව්‍යාපාරවලට සාපේක්ෂ ව වැඩි ප්‍රාග්ධන ප්‍රමාණයක් රැස්කරගැනීමට අවස්ථාව පවතී.

**හවුල්කරුවන් සතු විවිධ දක්ෂතා ප්‍රයෝජනයට ගතහැකි වීම**

හවුල් ව්‍යාපාරය සඳහා විවිධ පුද්ගලයන් සහභාගී වන බැවින් ඒ ඒ හවුල්කරුවන් සතු විශේෂ දක්ෂතා යොදා ගැනීමට හැකි වේ. වෘත්තීය ව්‍යාපාර සඳහා හවුල් ව්‍යාපාර ක්‍රමය වඩාත් යෝග්‍ය වන්නේ මේ හේතුවෙනි.

- **වගකීම හවුල්කරුවන් අතර බෙදී යාම**

  ව්‍යාපාරික කටයුතු තුළින් පැන නගින වගකීම් එම හවුල්කරුවන් අතර බෙදී යයි.

- **සාමූහික තීරණ ගතහැකි වීම**

  හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් සියලු දෙනාගේ ම අදහස් විමසමින් සාමූහික ව වඩාත් නිවැරදි තීරණවලට එළැඹිය හැකි වේ.

### හවුල් ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ අවාසි

- **අසීමිත වගකීම**

  හවුල්කරුවන් ව්‍යාපාරයේ ණයතුරුස් සම්බන්ධ ව අසීමිත ව වගකිව යුතු වේ. මේ නිසා හවුල්කරුවන් යොදවන මුදලට වඩා ව්‍යාපාරයේ ණයතුරුස් වැඩි නම් එම ණය පියවීම සඳහා හවුල්කරුවන්ගේ පෞද්ගලික දේපල පවා කැපකළ යුතු වේ.

- **ලාභය හවුල්කරුවන් අතර බෙදී යාම**

  ඒක පුද්ගල ව්‍යාපාරයක උපයන ලාභ සියල්ල ම එහි අයිතිකරු සතු වුව ද හවුල් ව්‍යාපාරයක උපයන ලාභය හවුල්කරුවන් අතර බෙදී යයි.

- **හවුල් කරුවන් අතර මතභේද ඇතිවිය හැකි වීම**

  ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී හවුල්කරුවන් විසින් ගනු ලබන තීරණවල විවිධ මතභේද පැන නැගිය හැකි ය. එවැනි මතභේද ව්‍යාපාරයක අසාර්ථකත්වයට හේතු වේ.

- **අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම**

  හවුල්කරුවකුගේ මිය යාම, උමතු වීම වැනි හේතු නිසා හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට ද සිදු විය හැකි ය.

- **නෛතික පුද්ගලභාවයක් නොමැති වීම**

  හවුල් ව්‍යාපාරය නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පිළිනොගන්නා නිසා ව්‍යාපාරයේ නීතිමය කටයුතුවල දී හවුල්කරුවන් ඔවුන්ගේ පෞද්ගලික නම්වලින් ඒ සඳහා පෙනී සිටිය යුතු ය.

## සංස්ථාපිත සමාගම්

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ යුතු, නෛතික පුද්ගලභාවයක් සහිත, කොටස් නිකුත් කරමින් ප්‍රාග්ධනය සපයාගත හැකි සහ කොටස් හිමියන්ගේ වගකීම සීමිත වන්නා වූ සමාගම් සංස්ථාපිත සමාගම් ලෙස හැඳින්විය හැකි ය. මෙම සමාගම්වල අයිතිකරුවන් වන්නේ කොටස් මිලදී ගත් කොටස්කරුවන් ය. ඔවුන් මිලදී ගත් කොටස් වෙනුවෙන් ගෙවූ හෝ ගෙවීමට බැඳී සිටින වටිනාකමට පමණක් ඔවුන්ගේ වගකීම සීමා වේ.

## සංස්ථාපිත සමාගම්වල ලක්ෂණ

සීමාසහිත සමාගම්වල පොදුවේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- **සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීම**

  සංස්ථාපිත සමාගමක් ආරම්භ කිරීම සඳහා 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කළ යුතු ය. මෙහිදී පනතේ දක්වා ඇති විධිවිධානවලට අනුකූල ව අදාළ ලියවිලි සම්පූර්ණ කොට සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

- **අඛණ්ඩ පැවැත්මක් තිබීම**

  සමාගමක් එහි අයිතිකරුවන්ගෙන් වෙන් වූ ස්වාධීන ඒකකයක් ලෙස සැලකෙන බැවින් කොටස්කරුවන්ගේ මියයාම, බුංවත් වීම වැනි හේතු එහි ව්‍යාපාර කටයුතුවල අඛණ්ඩ පැවැත්මට බාධාවක් නොවනු ඇත.

- **සීමිත වගකීම සහිතව ලියාපදිංචි කළ හැකි වීම**

  එවැනි සමාගමක ණය හා වෙනත් බැඳීම් සම්බන්ධයෙන් කොටස් කරුවන්ගේ වගකීම සීමා සහිතය. එනම් කොටස්කරුවන්ගේ වගකීම මිලදීගත් කොටස්වල වටිනාකමට සීමා වේ. ඒක පුද්ගල ව්‍යාපාර හා හවුල් ව්‍යාපාරවල මෙන් ඔවුනට තමාගේ අනෙකුත් පෞද්ගලික දේපල ඒ සඳහා කැප කිරීමට සිදු නොවේ.

- **කොටස් නිකුතුවෙන් ප්‍රාග්ධනය රැස්කරගත හැකි වීම**

  සංස්ථාපිත සමාගමකට කොටස් නිකුත් කිරීම තුළින් ප්‍රාග්ධනය රැස්කර ගැනීමේ හැකියාව ඇත.

## සංස්ථාපිත සමාගම්වල වාසි

අනෙකුත් ව්‍යාපාර සංවිධානවලට සාපේක්ෂ ව සංස්ථාපිත සමාගම්වල ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන වාසි දක්නට ඇත.

- **වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි වීම**

  කොටස් නිකුත් කිරීමෙන් ප්‍රාග්ධනය රැස්කර ගැනීමට අවස්ථාව ලැබෙන නිසා විශාල ප්‍රාග්ධන ප්‍රමාණයක් රැස්කර ගැනීමට හැකියාව ඇත. ඉහළ පිළිගැනීම නිසා බාහිර පාර්ශ්වයන්ගෙන් ලබා ගන්නා ණය මගින් ද අරමුදල් රැස්කර ගැනීම පහසු වේ.

- **නෛතික පුද්ගලභාවයක් හිමි වීම**

  සමාගමක් නීතිය ඉදිරියේ දී නීතිමය පුද්ගලයෙකු ලෙස සැලකේ. මේ නිසා ගිවිසුම් ඇතිකර ගැනීම, නියෝජිතයන් පත්කර ගැනීම, වත්කම් අත්පත්කර ගැනීම මෙන් ම බදු ගෙවීම ආදී කරුණුවලදී සමාගම ට තම නමින් ක්‍රියා කළ හැකි ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

* **අඛණ්ඩ පැවැත්මක් තිබීම**

  සමාගමක කොටස්කරුවන් මිය යාම, බුංවත් වීම වැනි හේතු මත සමාගමේ පැවැත්මට බාධාවක් ඇති නොවේ. මේ නිසා සමාගමට අඛණ්ඩ ව ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට හැකි වේ.

* **වගකීම් සීමා සහිත වීම**

  සීමා සහිත සමාගමක කොටස්කරුවන්ගේ වගකීම ඔවුන් සමාගමේ ආයෝජනය කළ ප්‍රාග්ධනයට පමණක් සීමා වේ.

* **අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කිරීම**

  සමාගමක කොටස්කරුවන්ගේ ඡන්දයෙන් තෝරා පත් කර ගන්නා අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සමාගමේ කටයුතු කළමනාකරණය කෙරේ.

**සීමා සහිත සමාගම්වල අවාසි**

අනෙකුත් ව්‍යාපාරවලට සාපේක්ෂ ව සමාගම්වල දැකිය හැකි අවාසි කිහිපයක් පහත දැක්වේ.

* **නීතිමය විධි විධාන අධික වීම**

  සමාගම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම හා විසුරුවා හැරීම සම්බන්ධ ව බලපාන නීති රීති හා රෙගුලාසි අනෙකුත් ව්‍යාපාර සංවිධානවලට සාපේක්ෂ ව අධික බැවින් සමාගම්වල කටයුතු පවත්වාගෙන යාම සංකීර්ණ වේ.

* **ලාභය සහ අයිතිය බෙදී යාම**

  සමාගමක විශාල කොටස්කරුවන් ප්‍රමාණයක් සිටින අවස්ථාවක දී අයිතිය හා ලාභය බෙදීයාමක් සිදු වේ.

## සමූපකාර සමිති

සමූපකාර සමිතියක් යනු ප්‍රජාතන්ත්‍රවාදී ව පාලනය වන ස්වාධීන සංවිධානයකි. තව ද එය ස්වෙච්ඡාවෙන් එකට එකතු වී සාමූහික අයිතියක් භුක්ති විඳින පුද්ගල කණ්ඩායමක පොදු අවශ්‍යතා ඉටුකර ගැනීමට අරමුණු කර ගත් ව්‍යාපාරයකි. අවම වශයෙන් සාමාජිකයන් දස දෙනෙකුගේ සහභාගිත්වයෙන් සමූපකාර සමිතියක් ආරම්භ කළ හැකි අතර ප්‍රධාන වශයෙන් සාමාජික අරමුදලින් ප්‍රාග්ධනය සැපයීම සිදු කෙරේ. එමෙන් ම 1972 අංක 05 දරන සමූපකාර සමිති පනත යටතේ සමූපකාර සමිති ලියාපදිංචිය කළ යුතු වේ.

**නිදසුන් ඃ-**

ශ්‍රී ලංකා විවිධ සේවා සමූපකාර සමිති
ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමූපකාර සමිතිය
සමූපකාර ණය දෙන සමිති (සණස)

## සමූපකාර සමිතිවල ලක්ෂණ

සමූපකාර සමිතිවල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- **ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම**

  සෑම සාමාජිකයෙකුගේ ම ඡන්දයෙන් සමූපකාර සමිතියේ පාලන කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් තෝරා ගැනීම හා බහුතරයකගේ කැමැත්ත මත තීරණ ගැනීමේ හැකියාව වැනි ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ ලක්ෂණ සමූපකාර සමිතියක තිබේ.

- **ස්වෙච්ඡා හා විවෘත සාමාජිකත්වය**

  ඕනෑ ම අයෙකුට තමාගේ කැමැත්තෙන් සාමාජිකත්වය ලබා ගැනීමේ හා සාමාජිකත්වයෙන් ඉවත් වීමේ හැකියාව ඇත.

- **සාමාජිකයන්ගේ සාමූහික අයිතිය**

  සමූපකාර සමිතියක අයිතිය සමාජිකයන් සතුවන අතර එහි සියලු වත්කම් ද සාමාජිකයන් සියලු දෙනාට ම හිමි වේ.

- **පොදු අවශ්‍යතා හා අරමුණුවලින් යුක්ත වීම**

  සමූපකාර සංවිධානවල ප්‍රධාන ම අරමුණ වන්නේ තම සාමාජිකයන්ගේ සුභසිද්ධිය මෙන් ම සමාජයේ සංවර්ධනයට කටයුතු කළ යුතු වීමයි.

## සමූපකාර සමිතිවල වාසි

අනෙකුත් ව්‍යාපාර සංවිධානවලට සාපේක්ෂ ව සමූපකාර සංවිධාන ක්‍රමයේ පවතින වාසි කිහිපයක් පහත දැක්වේ.

- **ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම**

  සාමාජිකයන් වැඩි දෙනෙකුගේ කැමැත්ත මත පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා ගැනීමේ හා තීරණ ගැනීමේ අවකාශය ඇත.

- **සාමාජිකයන්ගේ ශුභ සාධනය වෙනුවෙන් කටයුතු කිරීම**

  සමූපකාර සමිති පොදු අරමුණු මුල්කරගෙන පිහිටුවන නිසා සෑම විට ම එය සමාජ වගකීම මෙන් ම සැමට සාධාරණත්වය යන සංකල්ප අගය කරමින් කටයුතු කරයි.

- **සමූපකාර සමිති පවත්වා ගැනීම වෙනුවෙන් විවිධ වූ රාජ්‍ය අනුග්‍රහ හිමිවීම**

- **ආර්ථික ප්‍රතිලාභ බෙදී යාම**

  සමූපකාර සමිතියක ව්‍යාපාර කටයුතු තුළින් උපයා ගනු ලබන අතිරික්තය විවිධ අයුරින් සාමාජිකයන් අතර බෙදේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

### සමූපකාර සමිතිවල අවාසි

* **ප්‍රාග්ධනය සීමිත වීම**

  සාමාජියන්ගේ සාමාජික ගාස්තුවලින් පමණක් ප්‍රාග්ධය සපයාගන්නා බැවින් රැස්කරගත හැකි ප්‍රාග්ධන ප්‍රමාණය සීමිත වේ.

* **සමූපකාර ප්‍රතිපත්ති මත ම කටයුතු කළ යුතු වීම**

  මෙම ව්‍යාපාර සංවිධාන වර්ගය පදනම් වී ඇත්තේ සමූපකාර ප්‍රතිපත්ති මත ය. එම ප්‍රතිපත්ති තුළ සීමාවීමට සිදුවීම නිසා තරගකාරී ව්‍යාපාර ලෝකයට මුහුණ දීමට අවශ්‍ය පරිදි ව්‍යාපාර කටයුතු වෙනස් කළ නොහැකි වේ.

## සමිති

සමාජ සුභසාධනය අරමුණු කරගත් සංවිධානයක් ලෙස සමිති හැඳින්විය හැකි ය. විශේෂයෙන් ම සාමාජික සුභසාධනය, ප්‍රජා සේවා හෝ පුණ්‍ය කටයුත්තක් පදනම් කරගෙන මෙවැනි සංවිධාන පිහිටුවාගෙන ඇත.

**නිදසුන් :-**

ක්‍රීඩා සමිති
ගොවි සමිති
අන්‍යෝන්‍යාධාර සමිති

## රාජ්‍ය සංස්ථා

සමාගම් පනත යටතේ හැර වෙනත් නීතියක් යටතේ සංස්ථාපනය කළ පූර්ණ අයිතිය රජය සතුවන හෝ අයිතියෙන් වැඩි ප්‍රමාණයක් රජය සතුවන ව්‍යාපාර රාජ්‍ය සංස්ථා ලෙස හැඳින්විය හැකි ය. රජය විසින් පත්කරන අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් රාජ්‍ය සංස්ථා පාලනය වේ. මෙම ව්‍යාපාර විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පනත් මගින් හෝ ආරම්භ කෙරෙයි. රාජ්‍ය නීතිගත සංස්ථාව, කොමිසම, අධිකාරිය, මණ්ඩලය සහ කාර්යාංශය යන නම්වලින් ද රාජ්‍ය සංස්ථා හඳුන්වනු ලැබේ.

**නිදසුන් :-**

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
ශ්‍රී ලංකා වරාය අධිකාරිය
පොල් සංවර්ධන අධිකාරිය
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
විදේශ සේවා නියුක්ති කාර්යාංශය
කෘෂි රක්ෂණ මණ්ඩලය

## රාජ්‍ය සංස්ථාවල ලක්ෂණ

අනෙකුත් ව්‍යාපාර සංවිධානවලට සාපේක්ෂ ව රාජ්‍ය සංස්ථාවල දැකිය හැකි ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- **අයිතිය හා පාලනය රජය සතු වීම**
  අයිතිය හා පාලනය පූර්ණ වශයෙන් රජයට හෝ වැඩි ප්‍රමාණයක් රජය සතු වේ. සුළු කොටස් ප්‍රමාණයක් පෞද්ගලික අංශය සතු වන අවස්ථා ද දක්නට ඇත.

- **නෛතික පුද්ගලභාවයක් තිබීම**
  රාජ්‍ය සංස්ථා නීතිමය කටයුතුවල දී වෙන ම පුද්ගලභාවයක් පවතී.

- **විශේෂ පනතක් හෝ පවත්නා පොදු පනතක් යටතේ ආරම්භ කළහැකි වීම**

- **අඛණ්ඩ පැවැත්මක් තිබීම.**
  පාර්ලිමේන්තුවෙන් සම්මත වූ පනතක් අනුව රාජ්‍ය සංස්ථා පිහිටුවන නිසා පැවැත්ම ද අඛණ්ඩ වේ.

## රාජ්‍ය සංස්ථාවල වාසි

- **අත්‍යවශ්‍ය සේවා සම්පාදනය සඳහා උචිත වීම**
  මහජනතාවට අත්‍යවශ්‍යවන බොහෝ සේවා පෞද්ගලික අංශය විසින් සැපයීමට ඉදිරිපත් නොවන අතර ඒවා සඳහා රාජ්‍ය සංස්ථා ක්‍රමය උචිත වේ.

  **නිදසුන් :-**
  ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
  ලංකා විදුලිබල මණ්ඩලය

- **පෞද්ගලික අංශයේ ඒකාධිකාරී බලපෑම් අවම කිරීමට දායක වීම**
  පෞද්ගලික අංශයේ ඒකාධිකාරී බලය තුළින් ඇතිකරන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා රාජ්‍ය සංස්ථා යොදාගනිමින් තරගකාරී පරිසරයක් නිර්මාණය කළ හැකි වේ.

  **නිදසුන් :-**
  ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

- **ලාභය මහජනතාව සතුවීම**
  රාජ්‍ය සංස්ථාවක් උපයන ලාභයෙන් කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සිදු වේ.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

### රාජ්‍ය සංස්ථාවල අවාසි

- තීරණ ගැනීමේ ස්වාධීනත්වය නැති වීම
- රජයේ මූල්‍ය රෙගුලාසිවලට යටත් වීම

## රාජ්‍ය දෙපාර්තමේන්තු

අමාත්‍යාංශයක් යටතේ ක්‍රියාත්මක වන මුළුමනින් ම රජයේ ඍජු පාලනයට අයත්වන ආයතන දෙපාර්තමේන්තු ලෙස හඳුන්වා දිය හැකි ය. බොහෝ විට මහ ජනතාව සඳහා විවිධ සේවා සැපයීමට දෙපාර්තමේන්තු ක්‍රියාත්මක වේ.

**නිදසුන් ඃ-**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව

### රාජ්‍ය දෙපාර්තමේන්තුවල ලක්ෂණ

අනෙකුත් ව්‍යාපාර සංවිධානවලට සාපේක්ෂ ව රජයේ දෙපාර්තමේන්තුවල දක්නට ලැබෙන ලක්ෂණ කිහිපයක් පහත දක්වේ.

- **අයිතිය හා පාලනය රජය සතු වීම**

  දෙපාර්තමේන්තුවල අයිතිය සම්පූර්ණයෙන් ම රජය සතු වේ. පාර්ලිමේන්තුවේ හා අදාළ අමාත්‍යාංශයේ ඍජු පාලනයට යටත් වේ. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් කළමනාකරණ හා පරිපාලන කටයුතු සිදු වේ.

- **නීතිමය කටයුතුවල දී දෙපාර්තමේන්තු ප්‍රධානියා සිය නිල නාමයෙන් පෙනී සිටිය යුතු වීම**

- **අඛණ්ඩ පැවැත්ම**

  රජයේ අභිමතය අනුව දෙපාර්තමේන්තුවල පැවැත්ම රඳා පවතී.

- **අරමුදල් රජය මගින් සැපයීම**

  රජයේ වාර්ෂික අය වැය ලේඛනය මගින් අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදනය කෙරේ.

### දෙපාර්තමේන්තුවල වාසි

- ජනතාවට අත්‍යවශ්‍ය වන සේවා සැපයීම බොහෝවිට දෙපාර්තමේන්තුවලින් සිදු වේ.

- විශාල ප්‍රාග්ධනයක් අවශ්‍ය දිගුකාලීන සංවර්ධනය සඳහා හේතුවන කටයුතු සඳහා දෙපාර්තමේන්තු මැදිහත් වේ.

- රජයේ දෙපාර්තමේන්තුවල විශාල සේවක පිරිසක් සේවය කරන නිසා විශාල රැකියා අවස්ථා ප්‍රමාණයක් සලසයි.

- ජනතාවගේ සුභ සිද්ධිය සඳහා ලාභ අපේක්ෂාවෙන් තොර ව සේවා සැපයීම දෙපාර්තමේන්තුවලින් සිදු වේ.

**දෙපාර්තමේන්තුවල අවාසි**

- රජයේ මූල්‍ය නීති සංග්‍රහය, ආයතන සංග්‍රහය හා විවිධ චක්‍රලේඛවලට අනුව දෙපාර්තමේන්තු කටයුතු කළ යුතු වීම හා තීරණ ගැනීමේ ස්වාධීනත්වය නැති වීම
- සේවයේ නියුතු අතිරික්ත සේවකයන් ප්‍රමාණය වැඩි නිසා ශ්‍රම පිරිවැය වැඩි වීම

## 3.2 යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීම

මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට සංවිධාන කළ හැකි විවිධ වර්ගයේ ව්‍යාපාර සංවිධාන පිළිබඳ ව ඉහතින් සාකච්ඡා කර ඇත. ව්‍යාපාරිකයන් විසින් එවැනි ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සැලකිල්ලට ගනු ලබන සාධක කිහිපයක් පහත දැක්වේ.

- අරමුණ අනුව
- පරිමාණය අනුව
- කළමනාකරණ කටයුතු සිදු කරනුයේ කවුරුන්ද යන්න අනුව

### අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන වර්ගයක් තෝරා ගැනීම

ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීමේ දී ප්‍රධාන වශයෙන් අරමුණු දෙකක් පදනම් වේ.

- ලාභ ලැබීමේ අරමුණ
- සමාජ සුභ සාධන අරමුණ

**ලාභ ලැබීමේ අරමුණ**

බොහෝ ව්‍යාපාරිකයෝ ලාභ ලැබීමේ අපේක්ෂාවෙන් ව්‍යාපාර කටයුතු කරගෙන යති. ලාභය උපරිම කිරීම මෙම ව්‍යාපාරිකයන්ගේ අරමුණ වේ.

ඉහත සඳහන් කළ ව්‍යාපාර සංවිධාන අතුරින් තනි පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම් හා රාජ්‍ය සමාගම් ආදිය ආරම්භ කරන්නේ ලාභ අරමුණු කර ගෙන ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

### සමාජ සුභ සාධන අරමුණ

මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකරමින් සමාජ සුභ සාධනය අරමුණු කරගත් ව්‍යාපාර සංවිධාන ද ක්‍රියාත්මක වේ. එවැනි සංවිධාන සාමාජිකයන්ගේ සුභ සිද්ධිය සඳහා කටයුතු කිරීම, විපත් හා අසහනයට පත් වූ ජනතාවට සහන සැලසීම වැනි අරමුණු පාදක කරගනී. පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ද මෙවැනි ව්‍යාපාර ක්‍රියාත්මක වේ.

**නිදසුන් :-**

- ගොවි සමිති, ක්‍රීඩා සමිති, මරණාධාර සමිති වැනි සමිති ව්‍යාපාර
- සමූපකාර සමිති
- රාජ්‍ය දෙපාර්තමේන්තු

මේ අනුව ව්‍යාපාරිකයා තමා අපේක්ෂා කරන අරමුණ මත සුදුසු ව්‍යාපාර වර්ගය තෝරා ගත යුතු ය.

## පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ගයක් තෝරා ගැනීම

ව්‍යාපාර වර්ගයක් තෝරා ගැනීමේ දී එහි පරිමාණය පිළිබඳ ව ද සලකා බැලිය යුතු ය. ව්‍යාපාරයක පරිමාණය තීරණය කිරීම සාධක කිහිපයක් මත රඳා පවතී. අයිතිකරුගේ මූල්‍ය ශක්තිය, කුසලතා හා පළපුරුද්ද සහ විවිධ සබඳතා ඒවා අතර ප්‍රධාන වේ. මීට අමතර ව ව්‍යාපාරය නිපදවන භාණ්ඩ හා සේවා ප්‍රමාණය, නිෂ්පාදනයට අදාළ වෙළඳපල කොටස ආදී සාධක ද ව්‍යාපාරයේ පරිමාණය තීරණය කිරීමේදී සලකා බැලිය යුතු ය.

මේ අනුව ප්‍රධාන වශයෙන් පරිමාණය අනුව ව්‍යාපාර වර්ග දෙකක් හඳුනා ගත හැකි ය.

- සුළු පරිමාණ ව්‍යාපාර
- මහා පරිමාණ ව්‍යාපාර

### සුළු පරිමාණ ව්‍යාපාර

බොහෝවිට ව්‍යාපාරයක් මුලින් ම ආරම්භ කරනුයේ සුළු පරිමාණ ව්‍යාපාර වශයෙනි. බොහෝ සුළු පරිමාණ ව්‍යාපාර ඒක පුද්ගල ව්‍යාපාර වේ. සුළු ප්‍රාග්ධනයකින්, අවම නීතිමය බලපෑම් යටතේ ආරම්භ කළ හැකි වීම හා තමාගේ දක්ෂතා උපරිම කිරීමට හැකි වීම ආදිය තනි පුද්ගල ව්‍යාපාරයක් තෝරා ගැනීමට හේතු වේ.

### මහා පරිමාණ ව්‍යාපාර

මහා පරිමාණයේ ව්‍යාපාරයක් ආරම්භ කළ හැකි වන්නේ ව්‍යාපාරිකයා සතු ව විශාල සම්පත් ප්‍රමාණයක් පැවතීම, වෙනත් ව්‍යාපාරවල සේවය කිරීමෙන් ලද පළපුරුද්ද, ව්‍යාපාර සඳහා දිරි ගැන්වීම් ලබා දෙන ජාල සබඳතා පැවැතීම හා රජයෙන් සැපයෙන යටිතල පහසුකම් හා වෙනත් දිරිගැන්වීම් ලබා දීම වැනි සාධක මත ය.

## කළමනාකරණය සිදු කරනුයේ කවුරුන් ද යන්න අනුව ව්‍යාපාර සංවිධාන වර්ගයක් තෝරා ගැනීම

කළමනාකරණය යනු ව්‍යාපාරයක් සතු සම්පත් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මග පෙන්වීම හා පාලනය කිරීම තුළින් ව්‍යාපාරයේ අරමුණු ඉටු කරගැනීම සඳහා කටයුතු කිරීමේ ක්‍රියාවලියකි.

ඒක පුද්ගල ව්‍යාපාරයක බොහෝවිට අයිතිකරු විසින් ම කළමනාකරණ කටයුතු සිදු කරනු ලැබේ. ඔහුට ව්‍යාපාරයේ සියලු ම කටයුතු සඳහා නිදහසේ තීරණ ගැනීමේ හැකියාව ඇත. එමෙන් ම ඔහු ව්‍යාපාරයේ අයිතිකරු, නායකයා සහ කළමනාකරු ද වේ.

මෙහිදී අයිතිකරු ලෙස අරමුදල් සම්පාදනය හා ආයෝජනය පිළිබඳ තීරණ ගැනීමේ නිදහස පවතී. එසේ ම නායකයෙකු ලෙස සම්පත් මෙහෙයවීම පිළිබඳ ස්වාධීන තීරණ ගත හැකි වේ.

ව්‍යාපාරයක කළමනාකරණ කටයුතු පුද්ගලයන් කිහිප දෙනෙකු මගින් සිදු කර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් හවුල් ව්‍යාපාර සංවිධානයක් හෝ සංස්ථාපිත සමාගමක් තෝරා ගැනීම උචිත වේ. මෙහිදී හවුල්කරුවන් සියලු දෙනාගේ ම කැමැත්ත මත ව්‍යාපාරය සම්බන්ධ තීරණ ගැනීමට හැකියාව ලැබේ.

# 3.3 ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම

ඒක පුද්ගල ව්‍යාපාරයක් අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් ව්‍යාපාර නාමය පවත්වාගෙන යන්නේ නම් ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.

**නිදසුන :-**

ගයාල් පෙරේරාගේ ව්‍යාපාරය " ගයාල් " නමින් පවත්වාගෙන යන්නේ නම් ව්‍යාපාර නාමය ලියාපදිංචි කළයුතු වේ.

මෙහිදී සිදුවන්නේ ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කිරීම පමණකි. එමගින් ව්‍යාපාරය සඳහා නෛතික පුද්ගලභාවයක් හිමි නොවේ.

### ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියා පදිංචි කිරීමේ නෛතික ක්‍රියා පටිපාටිය

ඒක පුද්ගල ව්‍යාපාරයක් අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන්නේ නම් අදාළ පළාත් සභා ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ ව්‍යාපාර නාමය ලියා පදිංචි කළ යුතු වේ. ඒ අනුව ව්‍යාපාර නම ලියාපදිංචි කිරීමේ බලධරයා වනුයේ අදාළ පළාත් සභාවේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා ය. ලියාපදිංචිය සඳහා අවශ්‍ය ඉල්ලුම් පත්‍රය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලබාගත හැකි ය. ලියා පදිංචි කිරීමට අදාළ ගාස්තු නියම කිරීම ඒ ඒ පළාත් සභාවලට පැවරී ඇති බලතල අනුව සිදු කෙරේ. එමෙන් ම ඒක පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කර දින 14 ක් ඇතුළත ව්‍යාපාර නාමය ලියාපදිංචිය සඳහා අයදුම්පත ඉදිරිපත් කළ යුතු වේ.

ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියා පදිංචිය සඳහා පහත දැක්වෙන ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතු ය.

01. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අදාළ ඉල්ලුම් පත්‍රය ලබා ගැනීම.

මේ සඳහා පහත දැක්වෙන ඉල්ලුම් පත්‍ර දෙක ලබාගත යුතු ය.

i ඒක පුද්ගල ව්‍යාපාර නාමය ලියා පදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.

ii ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය වන ග්‍රාම නිලධාරී වාර්තාව ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.

02. ග්‍රාම නිලධාරී සහතික කළ වාර්තාව සහ නිවැරදි ව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචියට අවශ්‍ය ගාස්තුව ද සමග ප්‍රාදේශීය ලේකම් වෙත බාර දීම

03. ප්‍රාදේශීය ලේකම් විසින් ඉහත ලේඛන සලකා බැලීමෙන් අනතුරු ව ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම. මෙම සහතිකය ව්‍යාපාරික ස්ථානයේ ප්‍රදර්ශනය කළ යුතු වේ.

## ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන

ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීම තුළින් පහත දැක්වෙන ප්‍රයෝජන අත්කර ගත හැකි ය.

- **අනන්‍යතාවක් ලැබීම**
  තම ව්‍යාපාරය වෙනත් ව්‍යාපාරවලින් වෙන්කොට හඳුනා ගැනීමේ වාසිය හිමි වීම

- **ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම**
  මෙහි දී අයිතිකරුගේ නමට ලියාපදිංචි වන බැවින් ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම

- **රජයෙන් ලබා දෙන දිරිගැන්වීම් ලබාගැනීමට සුදුසුකමක් වීම**
  ව්‍යාපාර සඳහා රජය විසින් විවිධ පහසුකම් සපයයි. එම පහසුකම් ලබා ගැනීම සඳහා ලියාපදිංචි ව්‍යාපාරවලට වැඩි අවස්ථාවක් සැලසීම

- **ණය ලබා ගැනීමේ දී පහසුවක් ලැබීම**
  නාමය ලියාපදිංචි කළ ව්‍යාපාර පිළිබඳ විශ්වාසයක් ඇතිවන නිසා ණය සැපයුම්කරුවන් ණය සැපයීම සඳහා පෙළඹෙනු ඇත.

## ක්‍රියාකාරකම 01

ඔබගේ ප්‍රදේශයේ පවතින සම්පත් භාවිත කරමින් ආරම්භ කළහැකි ඒක පුද්ගල ව්‍යාපාරයක් පිළිබඳ ව අවධානය යොමු කරන්න.

01. එම ව්‍යාපාරය සඳහා සුදුසු නමක් යෝජනා කරන්න.

02. එසේ ඒක පුද්ගල ව්‍යාපාරයක් ඇරඹීමෙන් ලැබිය හැකි ප්‍රතිලාභ පැහැදිලි කරන්න.

03. එවැනි ඒක පුද්ගල ව්‍යාපාරයක් ඇරඹීමෙන් අවාසිවලට මුහුණ පෑමට සිදුවිය හැකි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

04. එම ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කළ යුතු ද? හේතුව දක්වන්න.

05. ව්‍යාපාර නාමය ලියාපදිංචිය අවශ්‍ය වේ නම් ඒ සඳහා අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටිය පැහැදිලි කරන්න.

## ක්‍රියාකාරකම 02

පහත දැක්වෙන ශීර්ෂ යටතේ ඇති ව්‍යාපාර වර්ග අතර පවත්නා සමාන අසමානකම් දැක්වෙන වගුවක් සකස් කරන්න.

| ශීර්ෂය | තනි පුද්ගල ව්‍යාපාර | හවුල් ව්‍යාපාර | සීමාසහිත සමාගම් | සමූපකාර | රාජ්‍ය සංස්ථා | දෙපාර්තමේන්තු |
|---|---|---|---|---|---|---|
| අයිතිය | | | | | | |
| ප්‍රාග්ධනය සපයාගැනීම | | | | | | |
| වගකීම | | | | | | |
| කළමනාකරණය | | | | | | |
| නෛතික පුද්ගලභාවය | | | | | | |
| පැවැත්ම | | | | | | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 03

පහත දැක්වෙන්නේ ව්‍යාපාර ආයතන කිහිපයක නම් ය.

- සීමාසහිත නන්දු සමාගම
- ජනහිත ස්ටෝර්ස්
- සිල්වා සහ පුත්‍රයෝ
- සමූපකාර තොග වෙළඳ සංස්ථාව
- තරුණ බෞද්ධ සමිතිය
- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

01. ඉහත එක් එක් ව්‍යාපාර ආයතනය අයත් ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න.

02. එම ව්‍යාපාර ආයතන හිමිකාරිත්වය අනුව වර්ගකර දක්වන්න.

03. ව්‍යාපාර අරමුණු අනුව වර්ග කර, ඉහත දැක්වෙන ව්‍යාපාර එම වර්ගීකරණය යටතේ බෙදා දක්වන්න.

04. ඉහත ව්‍යාපාර ආයතනවලින් නීතිමය පුද්ගලභාවය සහිත ව්‍යාපාර ආයතන මොනවා ද?

05. මෙම ව්‍යාපාර ආයතන ප්‍රාග්ධන සම්පාදනය කර ගන්නා ආකාර වෙන වෙන ම දක්වන්න.

## ක්‍රියාකාරකම 04

පහන් සියලු දෙනාට ම සවන් දෙයි. සාමූහික තීරණ ගැනිමට මෙන් ම අවදානම් බෙදා ගැනිමට ද ඔහු කැමති ය. සාමූහික වැඩ පිළිබඳ ලොකු විශ්වාසයක් ඇති ඔහු මිතුරෙකුගේ වගකීමක් වුව ද බාර ගනී.

දිනුක තනිතීරණ ගැනීමට කැමති පුද්ගලයෙකි. ඔහුට ඕනෑ ම අවදානමක් තනිව විඳදරා ගැනීමට ශක්තිය ඇත. ඔහු සෑම විට ම තම කටයුතු සාර්ථක කර ගැනීමට දැඩි කැපවීමෙන් ක්‍රියා කරයි.

පහන් හා දිනුක ව්‍යාපාර ඇරඹීමට අපේක්ෂාවෙන් සිටී.

01. ඉහත කරුණුවලට අනුව පහන් ඇරඹිය යුත්තේ කුමන ව්‍යාපාර සංවිධාන වර්ගය දැයි යෝජනා කරන්න. ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

02. දිනුක ඇරඹිය යුතු ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් දැයි යෝජනා කරන්න. ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

03. පහන් සහ දිනුක එම ව්‍යාපාර සංවිධාන ආරම්භ කිරීමෙන් ඔවුනට අත් වන වාසි සහ අවාසි වෙන වෙන ම ලියන්න.